# දෙමළ ජනතාවගේ අප්‍රිකානු සම්භවය.

(වෛද්‍ය චන්න සුදත් ජයසුමන- වෛද්‍ය පීඨය, රජරට විශ්ව විද්‍යාලය )

අද අප ඉන්දියාව යනුවෙන් හදුන්වන රට බිහිවන්නේ ඉංග්‍රිසි පරිපාලනයේ ප්‍රතිඵලයක් ලෙස ය. ඊට පෙර ඉන්දියාව යනුවෙන් රටක් තිබුණේ නැත. වත්මන් ඉන්දියාවට අයත් ප්‍රදේශ ඊට පෙර පාලනය වුයේ රාජ වංශ අතින් ය. විවිධ නගර කේන්ද්‍ර කරගෙන මේ රජ පෙළපත් රාජධානි පිහිට වූ හ. ඒ ඒ රාජධානි වලට අයත් ප්‍රදේශ ද කලින් කලට වෙනස් විය.

දකුණු ඉන්දියාව ලෙස හදුන්වන ප්‍රදේශයේ අද ද එක් දේශපාලන ඒකකයක් හදුනා ගත නො හැක. අද මෙන්ම අතීතයේ දී ද එය එසේ ම විය.[1] නමුත් භූගෝලීය ලෙස සැලකූ විට දකුණු ඉන්දියාව ලෙස සාමාන්‍යයෙන් හදුන්වන්නේ ඉන්දියානු අර්ධද්වීපයේ පහළ භාගයේ නැගෙනහිර සිට බටහිරට විහිදෙන කි.මී. 1050 පමණ දිග වින්ධ්‍යා කඳු වැටියෙන් දකුණට පිහි භූමි භාගය යි.[2] සංස්කෘතික දකුණු ඉන්දියාව ලෙස සලකන්නේ තුංගභද්‍රා ගංගාවට පහලින් පිහිටි ප්‍රදේශය යි. මෙහිදී අපගේ වැඩි අවධානය යොමු වනුයේ එම සංස්කෘතික දකුණු ඉන්දියාව කෙරෙහි ය.

සෘජු ඉංග්‍රීසි පරිපාලනයෙන් වත්මන් ඉන්දියාවට අයත් ප්‍රදේශ නිදහස් වූයේ 1947 වසරේ දී ය. ප්‍රධාන වශයෙන් භාෂාව පදනම් කරගෙන 1950 දශකයේ දී වත්මනෙහි දක්නට ලැබෙන ප්‍රාන්ත රාජ්‍ය හදුන්වා දෙනු ලැබිණි. ඒ අනුව දකුණු ඉන්දියාව තුළ ප්‍රධාන ප්‍රාන්ත රාජ්‍ය 04 ක් බිහි විය.

පහත වගුවේ දක්වා ඇත්තේ ඒවායේ විස්තර ය.

| | ප්‍රාන්ත රාජ්‍යය | අග නගරය | භාෂාව | භූමිප්‍රමාණය (ව.කි.මී.) | ජනගහනය-2008(මිලියන) |
|---|---|---|---|---|---|
| 01 | තමිල්නාඩුව | චෙන්නායි | දෙමළ | 130058 | 65 |
| 02 | කේරළය | තිරුවනන්තපුරම් | මළයාලම් | 38863 | 32 |
| 03 | කර්ණාටකය | බැංගලෝරය | කන්නඩ | 191791 | 55 |
| 04 | ආන්ද්‍ර ප්‍රදේශය | හයිද්‍රාබාදය | තෙලුගු | 275068 | 76 |

දෙමළ, මලයාලම් ,කණ්නඩ හා තෙලුගු භාෂා 4 කතා කරන ජනගහනයේ එකතුව ඉන්දියාවේ මුළු ජනගහනයෙන් හතරෙන් පංගුවක් පමණ වේ. මේ භාෂා 4 ම ද්‍රවිඩ නමින් හදුන්වන භාෂා කුලකයට අයත් බැවි පැවැසේ (නමුත් තෙලුගු ද්‍රවිඩ භාෂා පවුල ට අයත් නො වන බව අපේ අදහසයි) එසේ වුවත් ද්‍රවිඩ යනුවෙන් හැදින්විය හැකි ජාතියක් හෝ ජනවර්ගයක්

ඉන්දියාවේ හෝ ලෝකයේ හෝ කොතැනකවත් නැත. ද්‍රවිඩ යනු භාෂා කුලකයක් පමණි. නමුත් අපේ රටේ දී දෙමළ ජනතාව හැඳින්වීමට "දෙමළ" වෙනුවට "ද්‍රවිඩ" යනුවෙන් යොදනු අපි දැක ඇත්තෙමු. දෙමළ යනුවෙන් පැවැසීමට අකමැති ඇතැම් උගතුන්ගේ හීනමානය නිසා එවැනි තත්ත්වයක් ඇති වූයේ යැ යි සිතිය හැක.

ද්‍රවිඩ භාෂා පවුලට අයත් භාෂා 26ක් පමණ අද වන විට භාවිතයේ ඇත. දෙමළ, මලයාලම් ,කන්නඩ ඒ අතුරින් ප්‍රධාන වේ. මේ භාෂා 26න් 25ක් ම ප්‍රධාන ලෙස භාවිතා වන්නේ ඉන්දියාව තුළ ය.[3] ඉහත දැක් වූ දකුණු ඉන්දීය ප්‍රාන්ත 4 ට අමතරව මහාරාෂ්ට, මධ්‍ය ප්‍රදේශ හා ඔරිස්සා ප්‍රාන්තවල ආන්ද්‍රයට සමීප ප්‍රදේශ කිහිපයක ද ද්‍රවිඩ භාෂා පවුලට අයත් තවත් භාෂා 10-12 පමණ කතා කරන ජනයා ජීවත් වෙති.

ද්‍රවිඩ භාෂා පවුලට අයත් සම්පූර්ණයෙන් ඉන්දියාවෙන් පිටත භාවිතා වන එකම භාෂාව බ්‍රාහුයි (Brahui) ය. පකිස්ථානු-ඇෆ්ගනිස්ථානු දේශසීමා ආසන්නයේ බලුකිස්ථානය නම් පකිස්ථානු පළාත තුළ බ්‍රාහුයි භාෂාව කතා කරන ජනයා මිලියනයක් පමණ වෙසෙති.

වත්මන් දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ භාෂා සහ එම භාෂා කතා කරන ජනතාවගේ සම්භවය පිළිබඳ අදහස් කිහිපයකි. තමිල්නාඩු දෙමළ ජාතිවාදී උගතුන්ගේ අදහස දෙමළ භාෂාව පළමුව ඇති වූ බවත් , ක්‍රමයෙන් එය උතුරට පැතිර ගොස් අනෙකුත් ද්‍රවිඩ භාෂා ඇති වූ බවත් ය. එනම් දෙමළ යනු ද්‍රවිඩ භාෂාවල "මව්" ලෙස සැලකිය හැකි භාෂාව යි. ඔවුන්ට අනුව මොහෙන්දජාරෝ-හරප්පා ශිෂ්ඨාචාර ගොඩනගා ඇත්තේ ද ද්‍රවිඩ භාෂා කතා කරන ජනතාව ය.[4]

දෙමළ ජාතිවාදී උගතුන් දරන තවත් අදහසක් වනුයේ "මුල් ද්‍රවිඩ" බස කතා කළ ජනයා උතුරු අප්‍රිකාවේ සිට මධ්‍යධරණීය ප්‍රදේශ, වත්මන් ඉරානය, ඇෆ්ගනිස්ථානය ,පකිස්ථානය, ඔස්සේ වයඹ දිග ඉන්දියාවට ඇතුල් වී ක්‍රමයෙන් පහළට සංක්‍රමණය වු බවයි. මේ ක්‍රියාවලිය සිදුවී ඇත්තේ ක්‍රි.පූ 6000 දී පමණ බව ඔවුහු පවසති. ඇතැම් විට මෙය "ද්‍රවිඩ පිවිසුම්වාදය" ලෙස ද හඳුන්වයි. ක්‍රි.පූ 6000 යන අගය මොවුන් ලබා දෙන්නේ කිසිදු ඓතිහාසික පදනමකින් නො වේ. ඒ සඳහා හේතු කාරණා වී ඇත්තේ "මොහෙන්දජාරෝ-හරප්පා ශිෂ්ඨාචාර ගොඩනගන ලද්දේ ද්‍රවිඩ භාෂා කතා කල ජනතාවය" යන පූර්ව නිගමනය යි.

1921 හා 1922 වසරවල වයඹ දිග ඉන්දියාවේ ඉන්දු ගංගා නිම්න ප්‍රදේශයේ සිදු කළ කැනීම්වලින් දියුණු ශිෂ්ඨාචාරයක නටබුන් මතු විය. සාමාන්‍ය පිළිගැනුම අනුව ඒ ශිෂ්ඨාචාරය විරාජමාන වී ඇත්තේ ක්‍රි.පූ 3000 සිට ක්‍රි.පූ 1500 පමණ දක්වා දිවෙන කාලවකවානුවේ දී ය. මෙම මොහෙන්දජාරෝ-හරප්පා ශිෂ්ඨාචාරය මාතෘ මූලික ශිෂ්ඨාචාරයක් ලෙස සැලකේ. ඒ අනුව

එම ශිෂ්ඨාචාරය ද්‍රවිඩ භාෂා කතා කරන ජනයා ගොඩ නගන ලද්දක් බවත්, ඔවුන් භාරතයට පැමිණියේ ක්‍රි.පූ 6000 දී පමණ විය හැකි බවත්, වන අදහස ඉදිරිපත් විය.

ක්‍රි.පූ 6000 දී පමණ වයඹ දිගින් භාරතයට ඇතුල් වූ ද්‍රවිඩ භාෂා කතා කරන ජනයා ක්‍රමයෙන් දකුණට සංක්‍රමණය වී දකුණු ඉන්දීය ප්‍රදේශයේ මුල් බැසගත් බව මේ දෙවන අදහසෙන් පැවැසේ. දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ භාෂා කතා කරන ජනයාගේ සම්භවය කෙසේ වෙනත් මොහෙන්දජාරෝ-හරප්පා ශිෂ්ඨාචාරයේ උරුමය ද්‍රවිඩ භාෂා කතා කළවුන්ට පැවරීමට අකමැති පිරිසක් වෙති. ඔවුහු බොහෝ විට උතුරු ඉන්දීය සම්භවයක් ඇති විද්වත්හු ය. නැතහොත් බටහිර විද්වත්හු ය. ඔවුන්ගේ අදහස ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය ආර්යයන්ගේ නිර්මාණයක් බවයි. මුල් ද්‍රවිඩ බස කතා කල ජනතාවගේ සංස්කෘතිය, ජීවන රටාව,භෞතික නිර්මාණ මොහෙන්දජාරෝ-හරප්පා ශිෂ්ඨාචාරයේ කිසිසේත් දැකිය නො හැකි බවත් ඒවා වඩා සමීප වන්නේ ආර්යයන්ගේ නිර්මාණවලට බවත් ඔවුහු පවසති. ඊට ප්‍රතිඋත්තර බිඳින ද්‍රවිඩ භාෂා කතා කරන ප්‍රභූන් (විශේෂයෙන් දෙමළ උගතුන්) පවසන්නේ ආර්යයන් යනු පීතෘ මූලික සමාජයක් උරුම කරගත් ජන කොටසක් බවත්, මාතෘ මූලික ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය ආර්යයන්ගේ නිර්මාණයක් විය නො හැකි බවත් ය. මොහෙන්දජාරෝ-හරප්පා ශිෂ්ඨාචාරය ද්‍රවිඩ ද ? ආර්යය ද ? අරභයා පැන නැගි මේ සංවාදය බොහෝ කලක් මුළුල්ලේ පැවත එයි.[5]

ආර්යයන් යනුවෙන් හඳුන්වන්නේ කැස්පියන් මුහුද අවට හා රුසියානු ස්ටෙප්ස් තැනිතලා ආශ්‍රිත ව ජීවත් වූ ජන කොටසකි . ඔවුහු ආර්යය භාෂාව කතා කළ හ. ඔවුන්ගේ සංස්කෘතිය ආර්යය සංස්කෘතිය විය. පසුව ආර්යයෝ ගෝත්‍ර ගණනාවක් ලෙස දුර බැහැර ප්‍රදේශවලට සංක්‍රමණය වූ හ. ආර්යයන් ගේ සමේ වර්ණය පැහැපත් වූ බවත්, ආරෝහ පරිණාහ දේහ සම්පත්තියෙන් යුක්ත වූ බවත්, යුද්ධයෙහි දක්ෂයන් වූ බවත් කියැ වේ. ඔවුන්ගේ සමාජය පීතෘ මූලික එකක් යැ යි සාමාන්‍යයෙන් පිළිගැනේ.

ප්‍රධාන වශයෙන් ම සත්ත්ව පාලනය ජීවිකාව කර ගත් ආර්යන්ගේ ජන ජීවිතය තුළ “ගවයාට” ඉහළ ස්ථානයක් හිමි විය. වටිනාකම දැක්වීමේ මිනුමක් ලෙස මුල් අවධියේ දී ආර්යයන් ගවයා යොදා ගත් බවක් ද පැවැසේ. ගවමස් අනුභව නො කළ යුතු දෙයක් ලෙස ඔවුහු සැලකූ හ. ගවයාට අමතරව අශ්වයාට ද ආර්යයන් විසින් ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබිණි. යුධ කටයුතුවල දී හා ප්‍රවාහන කටයුතුවල දී අශ්වයන් හැසිර වීමේ දැනුම ආර්යයෝ සතු වූහ. තවද ආර්යයෝ ඒක දේවවාදීන් වූ හ. යාග හෝම , බලි බෙලි ආර්ය සංස්කෘතියේ සුවිශේෂී ස්ථානයක් ඉසිලී ය.[6]

ආර්යයන් ගේ භාරතීය සංක්‍රමණය ගැන 1790 දී විලියම් ජෝන් නව අදහසක් මතු කළ අතර පසු ව මැක්ස් මුලර් එය ප්‍රවාදයක් බවට පත් කළේ ය. ඒ අනුව ක්‍රි.පූ. 1500 දී පමණ ආර්යයෝ උතුරු ඉරාන සානුව පසු කරමින් හින්දුකුෂ් දුර්ග මාර්ගය ඔස්සේ වත්මන් වයඹ, උතුරු ඉන්දීය ප්‍රදේශවලට සංක්‍රමණය වූ හ. “ආර්යය පිවිසුම්වාදය” (Aryan Invasion Theory) ලෙස හැඳින්වෙන මෙය ප්‍රවාදය නිර්මාණය වීමට මූලික ලෙස බලපා ඇත්තේ සංස්කෘත, ග්‍රීක හා ලතින් භාෂා අතර දක්නට ලැබෙන සමානකම් ය. මේ භාෂා ද අයත් පොදු භාෂා කුලකය ඉන්දු යුරෝපීය භාෂා යනුවෙන් හැඳින් වේ. ආර්යයන් වත්මන් ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයට පැමිණෙන විට ක්‍රි.පූ. 1500 පමණ වී නම් ඉන්දුනිම්න ශිෂ්ඨාචාරය ඔවුන්ගේ නිර්මාණයක් විය නො හැක. ක්‍රි.පූ. 1500 පමණ වන විට එම ශිෂ්ඨාචාරය අභාවයට පැමිණෙමින් තිබිණ. එසේ නම් ද්‍රවිඩයන් එම ශිෂ්ඨාචාරයේ ගොඩනැගූ බව සැබෑවක් විය හැකි ද? ආර්යයන් ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය ගොඩනොනැගූ පමණින් එය ද්‍රවිඩයන්ගේ වන්නේ නැත. එහි සැබෑ උරුමකරුවන් ආර්යයන් හෝ ද්‍රවිඩයන් හෝ නො වේ. අනාර්යයන් (ප්‍රාග් වෛදිකයන්) ය. බොහෝ දෙනෙකු වරදවා ගන්නා තැනැක් නම් ආර්යයන් නො වන සියල්ලන් ද්‍රවිඩයන් ලෙස සැලකීම ය. අපේ ප්‍රවාදය අනුව මුල් ද්‍රවිඩ බස කතා කරන ජනයා වයඹ දිග ඉන්දියාවට පැමිණ ඇත්තේ ක්‍රි.පූ. 06 වන සියවසේ දී පමණ ය. ඒ වන විට ආර්යයන්ගේ පැමිණීමෙන් මෙන් ම, ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය බිඳ වැටීමෙන් ද සියවස් දහයක් පමණ කල් ඉකුත් වී තිබිණ.

ආර්යයන් හා මුල් ද්‍රවිඩ බස කතා කරන ජනතාව පැමිණීමට පෙර මෙම ප්‍රදේශවල ජීවත් වූ ජනතාව අනාර්යයන් (ප්‍රාග් වෛදිකයන්) ලෙස හැඳින්විය හැකි බව නලින් ද සිල්වා මහාචාර්යයතුමා පෙන්වා දෙයි.[7] එතුමාට අනුව ඔවුන්ගේ සංස්කෘතිය “ප්‍රාග් වෛදික” සංස්කෘතියකි . වත්මන් ඉන්දියාව, පකිස්ථානය ලෙස හඳුන්වන ප්‍රදේශවල මෙන්ම අග්නිදිග ආසියාතික රටවල ද චීනයේ ද ලංකාවේ ද අනාර්යය ජන කොටස් ජීවත් වූහ. ලංකාවේ දී යක්ෂ, නාග, දේව, වැදි ලෙස හඳුන්වන්නේ එවැනි අනාර්යය ජන කොටස් ලෙස සැලකිය හැක. පොදු වශයෙන් අනාර්යයෝ දුඹුරු සහ කහ පැහැති සමක් දැරූහ.

දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ භාෂා කතා කරන ජනතාවගේ සම්භවය ගැන සලකන විට පැවසිය හැක්කේ, මුල් ද්‍රවිඩ බස කතා කරන ජනයා උතුරු අප්‍රිකාවේ (විශේෂයෙන් නුබියානු කාන්තාරය ආශ්‍රිත ප්‍රදේශවල) සිට වත්මන් දකුණු ඉන්දීය ප්‍රදේශයට ක්‍රි.පූ. 06 වන සියවසේ දී පමණ සංක්‍රමණය වී ඇති බවයි. ඓතිහාසික, පුරා විද්‍යාත්මක සහ විශේෂයෙන් වාග් විද්‍යාත්මක කරුණු කාරණා මේ අදහසට අවශ්‍ය පසුබිම සකසා දෙයි.

වත්මන් අප්‍රිකාවේ, සෝමාලියාවේ සිට සෙනගාලය දක්වා දිවෙන කලාපය සහේල් තීරය (Sahel Belt) ලෙස හැඳින්වේ. එම ප්‍රදේශවල භාවිතා වන භාෂා පොදු වශයෙන් මෙලනො

අප්‍රිකානු (Melano African) භාෂා ලෙස හැදින්වේ. එකිනෙකට ස්වාධීන පාර්ශව 03ක් මගින් සිදු කළ වාග් විද්‍යාත්මත සොයා බැලීම්වලින් පැහැදිලි වී ඇත්තේ (Lilias Homburger ,Tidiane N'diaye, U.P.Upadhyaya & Mrs. S.P.Upadhyaya) ද්‍රවිඩ භාෂා මෙම මෙලනො අප්‍රිකානු භාෂා සමග ඉතා සමීප සබදතාවයක් දක්වන බවයි. [8]

ද්‍රවිඩ භාෂා සහ උතුරු අප්‍රිකානු බන්ටු බස සංසන්දනය කරන ප්‍රංශ ඉතිහාසඥයකු හා පුරා විද්‍යාඥයකු වන **බර්නාඩ් සර්ජන්ට්** පවසන්නේ, මේ භාෂා අතර ඉතා සමීප උච්චාරණ විධි, ව්‍යාකරණ රීති පවතින බවයි.[9] මේ අතර 1976 වසරේ දී තම පර්යේෂණ වාර්තාව එළි දක්වන කේ.පී. අර්වානන්, උතුරු අප්‍රිකානු හා ද්‍රවිඩ භාෂා අතර දැකිය හැකි පොදු ලක්ෂණ දහයක් ඉදිරිපත් කරයි.

උතුරු අප්‍රිකාවේ සිට භාරතයට සංක්‍රමණය වන අතර තුර මුල් ද්‍රවිඩ බස කතා කළ ජනතාව බොහෝ සාක්ෂි ඉතිරි කර ගොස් ඇත. ඉන් ප්‍රධාන වන්නේ ඔවුන්ගේ ගමන් මග වැටී තිබූ වත්මන් බලුකිස්ථාන ප්‍රදේශයේ තවමත් භාවිතා වන්නේ බ්‍රාහුයි භාෂාව යි. කිසිදු ඉන්දු යුරෝපීය භාෂාවකට නෑකම් නොකියන බ්‍රාහුයි බස ද්‍රවිඩ භාෂා පවුලේ සාමාජිකයෙකි. වත්මන් ඉන්දියාවෙන් පිටත භාවිතා වන එකම ද්‍රවිඩ භාෂාව ද එය යි. තව ද, වයඹ හා බටහිර ඉන්දියානු වෙරළ තීරය ඔස්සේ පහළට පැමිණි මුල් ද්‍රවිඩ බස කතා කල ජනතාව සින්ධි, ගුජරාටි හා මරාති භාෂා වලට බලපෑමක් සිදු කර ඇති බව වාග් විද්‍යාඥයෝ පවසති.[10]

ද්‍රවිඩ භාෂා පවුල ගැන අධ්‍යනයට කරන බර්නාඩ් සර්ජන්ට් තවත් ඉතා වැදගත් අදහසක් පළ කරයි. ඔහු පවසන්නේ ද්‍රවිඩ භාෂා පවුල තුළ දක්නට ලැබෙන භාෂා එකිනෙකින් වෙන් වී වැඩි ඈතක් නැති බව යි. දෙමළ හා මලයාලම් බස් එකිනෙක වෙන් වී සියවස් 8 - 10 කට වඩා වැඩි නැති බව ද ඔහු තවදුරටත් පෙන්වා දෙයි.

තව ද, උතුරු හා නැගෙනහිර අප්‍රිකානු ගෝත්‍රික ජනතාව ජල ප්‍රවාහන යාත්‍රා නිපදවීමට යොදා ගන්නා තාක්ෂණය දකුණු ඉන්දියාවේ දෙමළ බස කතා කරන ජනයා එම කටයුත්තට යොදා ගන්නා තාක්ෂණය ම බැව් පැවසේ. ඒ අයුරින් ම මේ දෙපිරිස කෘෂිකාර්මික කටයුතු වල දී උපයෝගී කරගන්නා තාක්ෂණික ක්‍රමවේදවල ද දැඩි සමානකමක් ඇත. දෙමළ ජනතාව "මුරුගන්" යන නමින් හදුන්වන දෙවියා නැගෙනහිර අප්‍රිකානු ගෝත්‍ර 25ක් පමණ "මුරුන්ගු" යන නමින් හදුන්වන බව ඒ ගැන අධ්‍යයනයක් කරන **ක්ලයිඩ් වින්ටර්** පවසයි.[11] වින්ටර් ට අනුව උතුරු අප්‍රිකානු ජන සමාජවල සහ දෙමළ ජන සමාජයේ දේපළ උරුම වන ක්‍රමය, අවමංගල්‍ය චාරිත්‍ර විධි, සංගීත භාණ්ඩ ආදියේ ද දැඩි සමානත්වයක් ඇත. ක්ලයඩ්

වින්ටර් දෙමළ ජනතාවගේ අප්‍රිකානු සබඳකම් පිළිබඳ බොහෝ කරුණු ඉදිරිපත් කර ඇත. වින්ටර් මේ ආකාරයේ ගවේෂණයක් කරන්නේ එක්තරා අරමුණක් වෙනුවෙනි. “යුරෝකේන්ද්‍රවාදයට”, එරෙහිව ඇන්ටා ඩයොප් ගොඩනැගූ “අප්‍රිකානුකේන්ද්‍රවාදය”ඉදිරියට ගෙන යන වින්ටර්ගේ අරමුණ ලොව පුරා ශිෂ්ඨාචාරය ගෙන ගියේ අප්‍රිකානුවන් බව පැවසීම යි. ඒ කරුණ සංගතව ඉදිරිපත් කිරීමට නො හැකි වුවද ඔහු ඉදිරිපත් කර ඇති ඇතැම් සාධක වැදගත් ය.

මුල් ද්‍රවිඩ බස කතා කළ ජනතාවට අප්‍රිකානු සම්භවයක් ඇති බවට ජෛවීය සාධක ද ඉදිරිපත් වී ඇත. ඔවුන්ගේ සමේ පැහැය, නළල් තලයේ හැඩය, අස්ථි පද්ධතිය උතුරු අප්‍රිකානු ජනතාවට සමීප නෑකම් දක්වන බැව් කියැ වේ. 1996 වසරේ පළ වූ “ Human Biology” සඟරාවේ 68 වැනි කලාපයේ ලිපියකින් පෙන්වා දී  ඇත්තේ දකුණු ඉන්දීය ද්‍රවිඩ බස කතා කරන ජනයාගේ දේහ සෛලවල මයිටකොන්ඩ්‍රියා ඩී.එන්.ඒ. හා අප්‍රිකානු ජනයාගේ මයිටකොන්ඩ්‍රියා ඩී.එන්.ඒ. අතර සමීප සබඳතාවයක් ඇති බව යි. ස්වීඩනයේ උමියා විශ්වවිද්‍යාලයේ ජාන වෛද්‍යවිද්‍යා දෙපාර්තමේන්තුව සිදු කළ අධ්‍යයනයකින් ද එවැනි ම ප්‍රතිඵල ලැබී ඇත.

ක්‍රි.පූ. 700 දී පමණ භාරතයට ඇතුළු වූ මුල් ද්‍රවිඩ බස කතා කරන ජනයා වයඹ හා බටහිර ඉන්දියානු වෙරළ ඔස්සේ පහලට පැමිණ වින්ධ්‍යා කඳු වැටිය තරණය කරමින් දකුණු ඉන්දියාවට පැමිණිය හ. එවකට එම ප්‍රදේශවල විසූ යේ අනාර්යය ගෝත්‍ර වලට අයත් ප්‍රාග් වෛදික සංස්කෘතියට අයත් ජනතාව සහ ආර්යය සංස්කෘතියක් දැරූ උතුරු ප්‍රදේශයේ සිට පැමිණි ආර්යයන් ය

මහාචාර්ය නීලකණ්ඨ ශාස්ත්‍රි පවසන්නේ ආර්යයන් ක්‍රි.පූ. 1000 දී පමණ දකුණු ඉන්දියාවට පැමිණ ඇති බවයි.[12]  පසුව චෝළ, චේර, පාණ්ඩ්‍ය ආදී රාජවංශිකයන් ලෙස පෙනී සිටියේ උත්තර භාරතයේ සිට  පැමිණි ආර්යයන් ය. ක්‍රි.පූ. 3 සියවසයේ දී අශෝක රජතුමා පිහිට වූ ශිලා ලිපිවල මේ රාජවංශිකයන් ගැන සඳහන් වේ.  එනම් උත්තර භාරතීයයන් සමග සබඳතා පැවැත් වූ පිරිසක් ක්‍රි.පූ 3 සියවසය වන විට දකුණු ඉන්දියාවේ සිට ඇත.

මුල් ද්‍රවිඩ බස කතා කළ ජනයා දකුණු ඉන්දියාවට පැමිණෙන වින්ධ්‍යා කඳුවැටියට උතුරින් පිහිටි ප්‍රදේශය බටහිර සිට නැගෙනහිර දෙසට ක්‍රමයෙන් වෛදිකකරණය වෙමින් පැවතිණි. දුඹුරු පැහැති සමක් දැරූ අනාර්යයන් ව යුධමය වශයෙන් පරාජය කළ ආර්යයෝ සංස්කෘතික හා දේශපාලන අංශ වලින් සිය ආධිපත්‍ය තහවුරු කිරීමට වර්ණ භේදය හඳුන්වා දුන් හ. පසුව කුල ක්‍රමය ලෙස භාරතීය සමාජය තුළ තහවුරු වුයේ ආර්යයන් හඳුන්වා දුන් මේ

වර්ණභේදවාදය යි. එහි ප්‍රතිඵලයක් ලෙස පැහැපත් සමක් නැති අනාර්යයන්ට වඩා තමා උසස් යැයි සම්මතයක් ඇති කර ගැනීමට ආර්යයෝ සමත් වූ හ.

ද්‍රවිඩ පිවිසුම්වාදය ඉදිරිපත් කරන දෙමළ ජාතිවාදී උගත්තු ද ද්‍රවිඩ භාෂා කතා කරන ජනතාව උතුරු අප්‍රිකානු ප්‍රදේශ වල සිට පැමිණි බව පිළි ගනිති. නමුත් ඔවුන් පවසන්නේ මේ ජනතාව අප්‍රිකාවේ සිට වත්මන් ඉන්දියාවට අයත් ප්‍රදේශ වලට පැමිණියේ ක්‍රි.පූ. 6000 දී පමණ බවයි. මෙම අදහස තහවුරු කිරීමට මේ උගතුන්ට කිසිදු සාධකයක් නැත. එපමණක් නොව වාග් විද්‍යාත්මක සොයා බැලීම්වලින් හෙළි වන්නේ මෙම සංක්‍රමණය සිදුව ඇත්තේ අදින් වසර 2500-3000 කට එපිට කාලයක දී බවයි. එනම් ක්‍රි.පූ. 500 සහ ක්‍රි.පූ. 1000 අතර කාල සීමාවේ දී ය. බර්නාඩ් සර්ජන්ට් මේ කරුණ නිරවුල් ව ඉදිරිපත් කරයි. වොන් ෆුරර් හයිමන්ඩෝර්ෆ් නම් විද්වතාට අනුව ද්‍රවිඩ භාෂා කතා කරන ජනතාවට දකුණු ඉන්දියාවට පැමිණ ඇත්තේ ක්‍රි.පු. 500 දී පමණ ය.

ක්‍රි.පු 700-500 දී පමණ මුල් ද්‍රවිඩ බස කතා කළ ජනයා දකුණු ඉන්දියාවට පැමිණෙන විට අනාර්යයන්ට අමතරව වරින් වර කුඩා කණ්ඩායම් ලෙස ඊට පෙර සංක්‍රමණය වූ අප්‍රිකානු නෙග්‍රිටෝවරු ද එහි ජිවත් වූහ. ඔවුහු කඳුකර ප්‍රදේශවලට සීමා වී සිටිය හ. මුල් ද්‍රවිඩ බස කතා කරන ජනයා ක්‍රි.පූ. 700 දී පමණ දකුණු ඉන්දියාවට පැමිණෙන විට ඔවුන්ගේ ද්‍රවිඩ බස, උතුරු හා දකුණු ලෙස බෙදී තිබිණ. උතුරු හා දකුණු ද්‍රවිඩ භාෂා එකිනෙක වෙන් වූ කාලය පිළිබඳ බර්නාර්ඩ් සර්ජනට් ගේ අදහස මේ කාල නිර්ණය හා ගැලපේ.

කල් ගත වීමේ දී දකුණු ද්‍රවිඩ බස කතා කළ ජනතාවගේ සංස්කෘතිය සහ දකුණු ප්‍රදේශයේ ප්‍රාග් වෛදික ජනතාවගේ සංස්කෘතිය එකිනෙකට අවශෝෂණය වූ බව සැලකිය හැක. ඇතැම් ස්ථානවල ප්‍රාග් වෛදික සංස්කෘතිවලට ද්‍රවිඩ බස කතා කළ ජනතාවගේ සංස්කෘතිය අවශෝෂණය විය. තවත් ස්ථානවල දී ද්‍රවිඩ සංස්කෘතියට ප්‍රාග් වෛදික සංස්කෘති අවශෝෂණය විය. මෙය දකුණු ඉන්දියාව **ද්‍රවිඩකරණය** වීම ලෙස හැඳින්විය හැක. **ද්‍රවිඩකරණය** සියවස් කිහිපයක් පුරා සිදුවු අතර එහි තීව්‍රතාවය තීරණය වුයේ ඒ ඒ සංස්කෘති වල ප්‍රබලතාව මතයි. ඊට අමතරව දේශපාලන හා ආර්ථික සාධක ද ඒ සඳහා බලපා ඇත.

වත්මන් තමිල්නාඩු ප්‍රදේශය සැලකු විට එහි ජීවත් වූ අනාර්යයන්ගේ ප්‍රාග් වෛදික සංස්කෘති, ද්‍රවිඩ බස කතා කල සංක්‍රමණික ජනතාවගේ සංස්කෘතියට මුළුමනින්ම පාහේ අවශෝෂණය විය. එහි ප්‍රතිඵලය වූයේ අනාර්යය ලක්ෂණ අවම ද්‍රවිඩ සංස්කෘතියකි. දෙමළ භාෂාව බිහිවන්නේ එම නව සංස්කෘතියේ ය. නමුත් වත්මන් කේරළ , කර්ණාටක ,ආන්ද්‍ර ප්‍රදේශ සැලකු විට ද්‍රවිඩ සංස්කෘතියෙන් ඇති කළ බලපෑම අනුපිළිවෙලින් අවම විය. විශේෂයෙන්

ආන්ද්‍ර ප්‍රදේශ සැලකූ විට එහි සිදු වූයේ ප්‍රාග් වෛදික සංස්කෘතියට ද්‍රවිඩ භාෂා කතා කළ ජනතාවගේ සංස්කෘතියේ ඇතැම් අංග අවශෝෂණය වීම යි. මේ හේතුවෙන් ආන්ද්‍ර ප්‍රදේශයේ බිහි වූ සංස්කෘතියේ ප්‍රමුඛ ධාරාව වූයේ ප්‍රාග් වෛදික සංස්කෘතියයි. එනම් ආන්ද්‍රයේ ඇති වුයේ ද්‍රවිඩ නො වන සංස්කෘතියකි.

වත්මන් දකුණු ඉන්දීය භාෂා තුළින් ද මේ කරුණ වටහා ගත හැක. ක්‍රි.පූ. 700-500 අතර දී දකුණු ඉන්දියාවට පැමිණි දකුණු ද්‍රවිඩ බස කතා කළ ජනයාගේ සංස්කෘතිය එම ප්‍රදේශවල පැවති අනාර්ය සංස්කෘති හා එකිනෙකට අවශෝෂණය වෙමින් ක්‍රි.ව 5-6 සියවස් වන විට නව භාෂා කිහිපයක් බිහි කළේ ය. ඒ දෙමළ,කන්නඩ හා තෙලුගු ලෙසයි. මලයාලම් බස යනු ක්‍රි.ව. 12 වන සියවසේ දී පමණ දෙමළ භාෂාවෙන් බිඳී ගිය භාෂාවකි. මුල් ද්‍රවිඩ බස කතා කළ ජනතාවගේ සංස්කෘතිය ප්‍රබල වූ තමිල්නාඩු ප්‍රදේශයේ බිහි වූ දෙමළ භාෂාව මුල් ද්‍රවිඩ බසට වඩා සමීප විය. මලයාලම්, කන්නඩ, තෙලුගු භාෂා ඔස්සේ එම සමීපත්වය කෙමෙන් අඩු වේ.

ද්‍රවිඩ භාෂා පිළිබඳ අධ්‍යයනය කරන භද්‍රිරාජු ක්‍රිෂ්ණමූර්ති දකුණු ද්‍රවිඩ භාෂා කොටස් දෙකකට බෙදා දක්වයි.[13] ඒ තෙලුගු හා අනෙකුත් (දෙමළ,මලයාලම්, කන්නඩ,) ලෙසයි. ඔහුට එවැනි බෙදීමක් කිරීමට සිදු වූයේ ද තෙලුගු භාෂාව අන් භාෂා වලට වඩා මුල් ද්‍රවිඩ බසට දක්වන නෑකම අඩු නිසා විය හැක. ආන්ද්‍ර ප්‍රදේශ ආශ්‍රිතව ද්‍රවිඩ යැයි හැඳින්වෙන භාෂා කිහිපයක් (10-12 පමණ) ඇත. යම් හෙයකින් පසුව පැමිණි ද්‍රවිඩ සංස්කෘතිය ආන්ද්‍රයේ ආධිපත්‍යය ලබා ගත්තේ නම් මේ ආකාරයෙන් භාෂා කිහිපයක් වෙනුවට ප්‍රාදේශීය වෙනස් කම් සහිත එක් බසක් පමණක් ඇති වීමට වඩා ඉඩ කඩ තිබිණි. නමුත්, සිදු ව ඇත්තේ පැවති අනාර්යය සංස්කෘතික භාෂා වලට දකුණු ද්‍රවිඩ භාෂාවේ යම් යම් අංග අවශෝෂණය වීමකි. මේ නිසා එක් ප්‍රබල බසක් වෙනුවට තෙලුගු සහ තවත් භාෂා කිහිපයක් ආන්ද්‍රය අවට බිහි විය. ද්‍රවිඩ භාෂාවක දැකිය හැකි ඇතැම් ලක්ෂණ අඩංගු වු පමණින් ද්‍රවිඩ තෙලුගු භාෂාවක් ලෙස හැඳින්වීමට සුදුසු නැත. සියුම් ලෙස සොයා බැලූ විට පෙනී යන්නේ ආන්ද්‍ර සංස්කෘතිය ද්‍රවිඩ සංස්කෘතියක් නො වන බවයි. අසල්වැසි දෙමළ සංස්කෘතික බලපෑම නිසා යම් ලක්ෂණ ආරෝපණය වුවද ආන්ද්‍ර සංස්කෘතිය මෙන්ම තෙලුගු භාෂාව ද අනාර්යය/ප්‍රාග් වෛදික ලෙස සැලකීම වඩා සුදුසු ය.

මුල් ද්‍රවිඩ භාෂාවට, දෙමළ භාෂාව දක්වන සමීපත්වය හේතුවෙන් ඇතැම් දෙමළ උගත්තු දෙමළ භාෂාව ද්‍රවිඩ භාෂා පවුලේ “මව්” ලෙස හඳුන්වති. නමුත්, අප දැක්වූ පරිදි දෙමළ භාෂාව මුල් ද්‍රවිඩ බසට සමීප වන්නේ තමිල්නාඩු ප්‍රදේශයේ දී “මුල් ද්‍රවිඩ බස කතා කළ ජනයා” සංස්කෘතික ආධිපත්‍යය ලබාගත් හෙයිනි. මුල් ද්‍රවිඩ බසින් නව භාෂා ඇති වීමේ දී එම භාෂා

ඇති වූ සංස්කෘති මුල් ද්‍රවිඩ බසට කෙතරම් අවකාශය ලබා දුන්නේ ද යන කරුණු මත මේ සමීපත්වය තීරණය වේ. එසේ නැති ව දෙමළ යනු ද්‍රවිඩ භාෂා පවුලේ මව් ලෙස සැලකීම සුදුසු කටයුත්තක් නො වේ.

මේ සමගම ද්‍රවිඩ භාෂා කතා කළ ජනතාව දකුණු ඉන්දියාවට පැමිණීමට සියවස් කිහිපයකට පෙර එහි පැමිණි ආර්යයන් ගැනද යමක් පැවසිය යුතුය.ද්‍රවිඩ භාෂා කතා කළ ජනයාගේ සංස්කෘතිවලට අවශෝෂණය වීම වෙනුවට සිදු වූයේ ආර්යයන් වෙනම ම ජන කොටසක් ලෙස සමාජ ආධිපත්‍යය ලබා ගනිමින් දකුණු ඉන්දීය සමාජ තුළට ඇතුල් වීම යි. උස් මහත් සිරුරකින් හා පැහැපත් සමෙන් යුතු වූ ආර්යයෝ බ්‍රාහ්මණයෝ ලෙස සමාජ සංස්ථාවල ආධිපත්‍යය ඉසිලූ හ. වත්මන් දකුණු ඉන්දීය භාෂා සැලකුව ද ඒවායේ ආර්යය සංස්කෘතික බලපෑම දැකිය හැක. වෛදික චින්තනය තුළ බිහි වූ සංස්කෘත භාෂාවේ වැඩි බලපෑමක් තෙලුගු බසේ දැකිය හැක. කණ්නඩ, මලයාලම් , දෙමළ භාෂා ඔස්සේ එම බලපෑම අවම වේ.

ඇතැම් දෙමළ උගතුන් පවසන්නේ දකුණු ඉන්දීය බ්‍රාහ්මණ වංශිකයන් ආර්යය සම්භවයක් ඇති පිරිසක් නො වන බවත්, ඔවුන් ද මුල් ද්‍රවිඩ බස කතා කළ ජනතාවගෙන් ම පැවත එන බවත් ය. මේ අදහස දරණ ප්‍රකට උගතකු නම් සේෂා අයියන්ගර් ය.[14] ඔහු ද දෙමළ බ්‍රාහ්මණ වංශිකයෙකි. එසේ වුවත් අනෙකුත් ආර්යයන්ගෙන් ද්‍රවිඩ භාෂා කතා කරන ජන සමාජයේ ආර්යය බ්‍රාහ්මණයන් වෙන් කරගත හැකි ප්‍රබල සාධක ඉදිරිපත් කිරීමට අයියන්ගර් අපොහොසත් ය.

## පාදක සටහන්


01. Sastri,K.A.N;A History of South India,Oxford University Press,1966

02. .Balasubramanian S,K;,The History of South India,Pune,2004

03.. Krishnamurti,B; The Dravidian Languages, Cambridge Univercity press, 2003

04 . Iyenger,P.T.S; History of the Tamils, Asian Education Services,1995

05 Marshall,J;Mohenjo-daro and the Indus Civilization,vol I,Ideological Book house,1973

06 .Basham,A.L;The wonder That was India, 1967

07 ද සිල්වා නලින් සංසාරය සහ කර්මය , විදුසර, උපාලි පුවත්පත් සමාගම, 2004-01-21

08. Upadhyaya,U.P,Upadhaya,S.P;Dravidian and Negro-Africans,International Journal of Dravidian Linguistics,1975

09. Bernard,S; Gense de I’Inde,Payout,Paris,1997, Trans.Sunthar Visualingam, An .African Origin of the Dravidians

10. Samuel, G.J;Encyclopaedia of Tamil Literature,Institute of Asian Studies,Madras,1990

11. Winters,C.A;The Genetic Unity of Dravidian and African Language and Culture, proceeding of the 1st International Symposium on Asian Studies,Asian Research Service,Hong Kong, 1979

12. Sastri,K.A.N;A History of South India,Oxford University Press,1966

13. Krishnamurti,B; The Dravidian Languages, Cambridge Univercity press, 2003

14. Iyenger,T.R.S;Dravidian India,Asian Education Services,1995